www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව යුද්ධයේ මුව විටට ආපසු හැරේ

**Sri Lanka returns to the brink of war**

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශයක්**
**2004 අගෝස්තු 18**

1983 සිට මේ වන තෙක්, දැනට මත් ජීවිත 65,000කට වඩා බිලි ගෙන දිවයින පුරා ම ව්‍යසනයක් නිර්මානය කර ඇති, සිවිල් යුද්ධය යලි පිපිරීමේ අද්දරක දැන් ශ්‍රී ලංකාව පවතී. කොලඹ ආන්ඩුවත් දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයත් අතර සටන් විරාම ගිවිසුමක් අත්සන් කොට වසර දෙකහමාරක් ගතව ඇති මේ අවස්ථාවේ දෙපාර්ශ්වය ම සන්නද්ධ ගැටුම කරා යලි පැන ගැනීමේ සූදානමක යෙදී සිටී.

ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග යුද්ධයේ බීජ වැපිරීමේ යෙදී සිටින බවට, සමාජවාදී සමානතා පක්ෂය, යලි යලිත් අනතුරු අඟවා ඇත. ඇය 2002 හා 2003 දෙවසර පුරා ම මිලිටරි ධුරාවලිය හා ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සමග රහසින් සන්ධානගතව, හිටපු එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව එල්ටීටීඊය සමග ගෙන යන සාකච්ඡාවල දී ජාතිය පාවා දී ඇතැයි එම ආන්ඩුව හෙලා දකිමින්, එයට විරුද්ධව, දිග්ගැසුනු ස්වෝත්තමවාදී උද්ඝෝෂනයක යෙදුනා ය. එසේ කිරීමේ දී ඇය තමාට ම පාලනය කර ගත නොහැකි බලවේග, ඉව බව නැතිව, මුදා හැර ඇත.

අපගේ අනතුරු ඇඟවීම් සනාථ වී තිබේ. අප්‍රේල් මස බලයට පත් වූ හෙලත්තාඩු සුලුතර ආන්ඩුවේ ප්‍රධානියා ලෙස, කුමාරතුංග, විදේශ ආධාර හා ආයෝජන රටට අඛන්ඩව ගලා ඒම සහතික කර ගැනීමේ ප්‍රයත්නයක් හැටියට, එල්ටීටීඊය සමග, ඈන හිට පවත්නා සාකච්ඡා යලි ඇරඹීමට උත්සාහ කර ඇත. එහෙත් ඇගේ හවුල්කරුවෝ -- මිලිටරිය සහ ජවිපෙ -- විරුද්ධ දිශාවට ඇදීම් කරති.

කුප්‍රකට මිලිටරි රහස් ඔත්තු අංශය ඇතුලු සන්නද්ධ හමුදාවල කොටස් නැගෙනහිර පලාතේ එල්ටීටීඊයට පක්ෂපාතී පුද්ගලයන්ට පහර දීම පිනිස වී. මුරලිදරන්ගේ (කරුනා) නායකත්වයෙන් යුත්, එල්ටීටීඊයෙන් බිඳුනු කන්ඩායමක්, උසිගැන්වීමෙහි ක්‍රියාකාරීව යෙදී ගෙන ඇත. එම ක්‍රියාව, බලාපොරොත්තු විය හැකි පරිදි ම, ප්‍රචන්ඩ ප්‍රතිචාරයක් අවුලුවා තිබේ. මෙම සිද්ධීන්ට තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැතැයි හමුදාව පුන පුනා කියා ඇතත් මිලිටරි රහස් ඔත්තු අංශය, කරුනා සති ගනනාවක් තිස්සේ කොලඹ රහසිගත නිවාසයක තබා ගෙන ඔහුට ආරක්ෂාව සැපයූ බවට තොරතුරු හෙලි වීමත් සමග, පසු ගිය මාසයේ දී, හමුදාවේ බොරු ප්‍රකාශ පිපිරී ගියේ ය.

තථ්‍ය වසයෙන් ගත් කල රහස් ඒජන්තයන් යොදා ගෙන කෙරෙන යුද්ධයක් නැගෙනහිර පලාතේ සහ කොලඹ දැනට මත් සිදු වෙමින් පවතී. එහි දී, කන්ඩායම් දෙකට ම අයත් සටන්කරුවන් හා ආධාරකරුවන් ගනනාවක් ම ඝාතනයට ලක්ව ඇත. පසු ගිය මස දී එල්ටීටීඊය කොලඹට දිවි නසා ගන්නා බෝම්බකාරියක එවා, කරුනාට සහාය දෙන බව විවෘතව ම ප්‍රකාශ කර ඇති ආන්ඩුවේ ඇමතිවරයකු වන, ඩග්ලස් දේවානන්ද, ඝාතනය කිරීමේ ප්‍රයත්නයක යෙදුනි. ආරක්ෂක හමුදා, එම ප්‍රහාරය ගසාකමින්, අගනුවර සෝදිසි මුර පොලවල් යලි පිහිටුවූ අතර නඩු විභාග නැතිව දීර්ඝ කාල පරිච්ඡේදයක් පුද්ගලයන් රඳවා ගැනීමට ඉඩ සලසන, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත නම් රුදුරු නීතිය, යලි ක්‍රියාත්මක කරන ලෙස කුමාරතුංගට බල කලේ ය.

එමෙන් ම, පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (එජනිස) කොටස්කරුවකු වන ජවිපෙ මොන යම් හෝ සාම සාකච්ඡාවකට දැඩි ලෙස විරුද්ධව සිටී. ජවිපෙ නායකයෝ, ජන මාධ්‍යවල කොටසකගේ ද පිටුබලය සහිතව, උතුරු-නැගෙනහිර පලාත්වලට අන්තර් වාර ස්වයං-පාලන අධිකාරියක් (අයිඑස්ජීඒ) පිලිබඳ එල්ටීටීඊයේ ඉල්ලීම හේතු කොට ගෙන, ඔවුන් සමග සාකච්ඡා පැවැත්වීම හෙලා දැක ඇති අතර කුමාරතුංග එසේ සාකච්ඡා පිනිස ඉදිරියට ගිය හොත් ඇගෙන් භේද වන බවට ද තර්ජනය කර සිටිති.

අයිඑස්ජීඒ පිලිබඳ මොන යම් හෝ සාකච්ඡාවක් අවසාන දේශපාලන විසඳුමක් ගැන කෙරෙන සාකච්ඡාවල කොටසක් විය යුතු ය යි ජවිපෙ අවධාරනය කරයි. එහෙත් ජවිපෙ හොඳින් දන්නා පරිදි, එවන් යෝජනාවක් "අන්තර් වාර" පාලනයක අරමුන මුලුමනින් ම නිරර්ථක කරන හෙයින් එය එල්ටීටීඊයට පිලිගත නොහැකි දෙයකි. සටන් විරාමය අත්සන් කිරීමෙන් පසුව මේ දක්වා ම, වෙනම දෙමල රාජ්‍යයක් පිලිබඳ සිය ඉල්ලීම අතහැර දැමීම වෙනුවෙන්, එල්ටීටීඊයට කිසිවක් ලැබී නැත. තමන්ගේ ම සාමාජිකත්වය තුලත්, පැරනි යුද කලාපවල පවත්නා භයංකර කොන්දේසිවලට දිගට ම මුහුන දෙන දෙමල ජනතාව අතරත්, සිය සහයෝගය ගොනු කර ගැනීමේ විධි ක්‍රම සෙවීමෙහි ලා එල්ටීටීඊය මංමුලා සහගතව සිටී.

අයිඑස්ජීඒ යනු රට බෙදීමේ කුමන්ත්‍රනයක් ලෙස හෙලා දකිමින් ද එය පිලිගැනීම වනාහි ද්‍රෝහීකමකට

සම වන ක්‍රියාවක් බව සඳහන් කරමින් ද ජවිපෙ දැන් යුද බෙර වැයීමේ යෙදී සිටී. ජවිපෙ ස්වෝත්තමවාදී වාචාල දෙඩවිලිවලට විරුද්ධ වන අය "සාම කොටි", එනම් එල්ටීටීඊ ඒජන්තයන් ලෙස හෙලා දකිනු ලබන අතර සාම සාකච්ඡා සඳහා පහසුකම් සපයන නෝර්වේජියානුවන් "සුදු කොටි" ලෙස හංවඩු ගසා ඇත. ජවිපෙ උද්ඝෝෂනය සාම සාකච්ඡා පීලිපැන්වීමේ තර්ජනය මතු කරන්නේ වී නමුදු කුමාරතුංග එයට විවෘතව එරෙහි වී නැත.

සාකච්ඡා යලි ඇරඹීමට දරා ඇති ප්‍රයත්නයන් හිර වී ඇත. පසු ගිය මාසයේ නෝර්වේජියානු නියෝජ්‍ය විදේශ ඇමති විඩාර් හෙල්ජසන්ගේ සූක්ෂ්ම රාජ්‍ය තාන්ත්‍රික ප්‍රයත්නයෝ සාකච්ඡා සඳහා කිසියම් පදනමක් දැමීමට අසමත් වූහ. ඔහු කොලජින් පිටව ගියේ මෙසේ අනතුරු අඟවමිනි: "අපට දක්නට ලැබෙන්නේ කෙලවරවලින් උනු වී දියව යාම ඇරඹී ඇති මිදුනු යුද්ධයකි." නැගෙනහිර පලාතේ ඝාතනයන්ට අවධානය යොමු කරමින් ඔහු ප්‍රකාශ කලේ, සාම ක්‍රියා දාමය දැන් පවතින්නේ එහි "වඩාත් ම භයානක කාල පරිච්ඡේදයේ" බව යි. ඔහු තත්වය අතිශයෝක්තියට නංවන බවට කොලඹ මාධ්‍ය චෝදනා කල විට, හෙල්ජසන් පෙරලා පිලිතුරු දුන්නේ "ගින්දරත් එක්ක සෙල්ලම් කරන උදවිය ඉන්නවා, එහෙම කරන එක ඇත්තෙන් ම විශාල අවදානම් වැඩක්" යනුවෙනි.

ශ්‍රී ලංකාව යුද්ධයට ඇද වැටීමට කෙතරම් නම් සමීප ද යන වග, කුමාරතුංග මේ සතියේ *යුනයිටඩ් ප්‍රෙස් ඉන්ටර්නැෂනල්* ප්‍රවෘත්ති සේවයට දුන් ප්‍රකාශයකින් අවධාරනය වුනි. නැගෙනහිර පලාතේ කාන්ඩායමික ඝාතන දිගට ම සිදු වුව හොත් එහි එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලට ඇතුලු වන ලෙස ආන්ඩුවේ හමුදාවට අන දෙන බවට ඇය එහි දී අනතුරු ඇඟවූවා ය. එවන් පියවරක් සටන් විරාමය ඉරා දැමීමකට සම වන අතර පුලුල් යුද්ධයක් යලි පිපිරීමට ඉක්මනින් ම තුඩු දෙනු ඇත. එමෙන් ම, එල්ටීටීඊය මුරන්ඩු ලෙස හැසිරෙන බවට චෝදනා කරමින්, සාකච්ඡා යලි ඇරඹීම සඳහා අවශ්‍ය පදනම සම්බන්ධයෙන් කිසිදු එකඟතාවක් නැති බව ද ජනාධිපතිනිය තහවුරු කලා ය.

මෙම අතිශයින් ම චංචල තත්වය මධ්‍යයේ වඩාත් ම බියකරු පෙර නිමිත්ත වී ඇත්තේ ලෝක බලවතුන්, අන් සියල්ලට මත් වඩා වොෂිංටනය, පවත්වා ගෙන යන නිශ්ශබ්දතාව යි. එක්සත් ජනපදය, කලාපය තුල වැඩෙන ඇමරිකානු ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා තර්ජනයට ලක් කරන ගැටුමක් අවසානයකට ගෙන එන විධි ක්‍රමයක් ලෙස සලකා, ශ්‍රී ලංකාවේ "සාම ක්‍රියා දාමයට" සහාය දුනි. විශේෂයෙන් ම ඉන්දියාව, මේ වන විට මැද පෙරදිග හා මධ්‍යම ආසියාව තුල සිය ආධිපත්‍යය තහවුරු කර ගැනීමේ එක්සත් ජනපද සැලසුම්වල ප්‍රධාන මූලෝපායික සහකරුවකු ද සුවිශේෂිව ගත් කල තොරතුරු තාක්ෂනය සම්බන්ධිත කර්මාන්ත තුල, වැදගත් ලාභ ශ්‍රම උල්පතක් ද බවට පත්ව ඇත.

බුෂ් ආන්ඩුව සාම සාකච්ඡාවන්ට පිටුබලය සැපයූ නමුත් එය අවධාරනය කර ඇත්තේ එල්ටීටීඊය ආයුධ බිම තබා මොන යම් හෝ සම්මුතියක යටත් මට්ටමේ ක්‍රියා කලාපයක් භාර ගත යුතු බව යි. එය එල්ටීටීඊය සිය "ත්‍රස්තවාදී" සංවිධාන ලැයිස්තුවේ දිගට ම තබා ගෙන ඇත -- එය වනාහි "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" සන්දර්භය තුල අප්‍රකාශිත මිලිටරි තර්ජනයක් දරන නම් පට බැඳීමකි. පසු ගිය තුන් වසරක කාලය මුලුල්ලේ එක්සත් ජනපද හා ශ්‍රී ලංකා මිලිටරි හමුදා සිය සබඳතා ශක්තිමත් කර ගෙන තිබේ. ඉහල පෙලේ එක්සත් ජනපද මිලිටරි නිලධාරීන් ගනනාවක් මෙන් ම තත්ව තක්සේරු සහ අභ්‍යාස කන්ඩායම් ද කොලඹට පැමින දිවයිනේ උතුරේ හා නැගෙනහිර සංවේදී යුද කලාපවල ද සංචාරයේ යෙදී ඇත.

පනිවිඩය පැහැදිලිව මතු වී එයි: සාම ක්‍රියා දාමය බිඳ වැටුන හොත්, වොෂිංටනය යලි යුද්ධය ඇවිලෙන තත්වයක දී ශ්‍රී ලංකාවේ හමුදාවට පිටුබලය සපයනු ඇත. සාකච්ඡා සඳහා සහයෝගය දෙන බව එක්සත් ජනපදය තව මත් ආකාරගතව ප්‍රකාශ කරතත් පාර්ශ්වයන් සාකච්ඡා මේසය කරා යලි තල්ලු කරනු පිනිස ගැනෙන, කිසියම් ඉහල මට්ටමක, ප්‍රයත්නයන් පිලිබඳ කිසිදු සාක්ෂ්‍යයක් දක්නට නැත. තථ්‍ය වසයෙන් ගත් කල, එක්සත් ජනපද මිලිටරි හා රහස් ඔත්තු කව සමග සමීප සබඳතා පවතින, එක්සත් ජනපද චින්තන පර්ශදයක් වන *ස්ට්‍රැට්ෆෝර්* පෙන්නුම් කලේ, ශ්‍රී ලංකා මිලිටරිය කරුනා යොදා ගෙන සිදු කරන ප්‍රකෝපකාරි ක්‍රියාවන්ට වොෂිංටනයේ "වක්‍ර සහයෝගය" ලැබෙන බව යි. පසු ගිය සතියේ පල වූ විශ්ලේෂනයක *ස්ට්‍රැට්ෆෝර්* මෙසේ අදහස් දැක්වී ය: "සැලසුම වන්නේ, කොටි සංවිධානය අස්ථාවර කොට, ගැටුමට පොලඹවා, බිඳුනු දෙමල ව්‍යාපාරය මුලුමනින් ම විනාශ කර දැමීමේ එල්ලය ඇති ප්‍රහාරයක් අවසානයේ දියත් කිරීම යි."

වොෂිංටනයේ කලාපීය මූලෝපායික සගයා වන නව දිල්ලිය ද ඊට සමාන ආස්ථානයක් ගෙන තිබේ. පසු ගිය මාසයේ දී, කොංග්‍රස් නායකත්වයෙන් යුත් අලුත් ආන්ඩුව, ශ්‍රී ලංකාව සමග ආරක්ෂක සහයෝගිතා ගිවිසුමක් (ඩීසීඒ) ඇති කර ගැනීමේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා අනුමැතිය දුන්නේ ය. එය වනාහි, එල්ටීටීඊය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී, ශ්‍රී ලංකා මිලිටරියේ හැකියාව සැලකිය යුතු ආකාරයෙන් ඉහල දමන ගිවිසුමකි. රහස් ඔත්තු අංශ අතර සහයෝගිතාව, ශ්‍රී ලංකාවේ විශේෂ බලකායන් පුහුනු කිරීම, උතුරේ යුද කලාපවලට හමුදා හා යුද උපකරන ගුවනින් ප්‍රවාහනය කිරීම සහ හොරෙන් ආයුධ ගෙන ඒමට එරෙහි මෙහෙයුම් ඇතුලු ඒකාබද්ධ නාවික මෙහෙයුම් ඩීසීඒ ගිවිසුමට ඇතුලත් වනු ඇත. එක්සත් ජනපදය මෙන් ම, ඉන්දියාව ද ශ්‍රී ලංකාව යුද්ධය දෙසට තල්ලු වී යාම සම්බන්ධයෙන් කිසිදු ප්‍රසිද්ධ අදහස් දැක්වීමක් කර නැත.

## ධනේශ්වරයේ දේශපාලනික බංකොලොත්කම

යුද තර්ජනය පිලිබඳව අනතුරු අඟවමින්, කුපිතව සිටි හෙල්ජසන්, කොලඹ පාලක කව වෙලා ගත් අත්‍යසාමාන්‍ය දේශපාලන අකර්මන්‍ය භාවයක් ලෙස තමන්ට පෙනී යන තත්වයක් ගැන සඳහන් කලේ ය. “මම (නැගෙනහිර) ප්‍රචන්ඩ ක්‍රියා පිලිබඳව කනස්සල්ලට පත්ව සිටිමි.” යි නෝර්වේජියානු ඇමතිවරයා පැවසී ය. “නමුත් (මා) එලෙස ම කනස්සල්ලට පත්ව සිටින්නේ පවතින පුදුමාකාර උදාසීනත්වය පිලිබඳව යි.” බොහෝ දෙනෙක් සාමයට කැමති නමුත් සාම ක්‍රියා දාමයට කැමති නැතැයි ඔහු පැහැදිලි කලේ ය.

එය ඔහුගේ අභිප්‍රාය නො වුනත්, හෙල්ජසන්ගේ අදහස් දැක්වීම්, ශ්‍රී ලංකාවේ පාලක පන්තියේ සියලු ම කොටස් ගර්හාවට ලක් කරන අධිචෝදනාවකින් සමන්විත වෙයි. පසු ගිය දශකය මුලුල්ලේ ම, එක් මැතිවරනයකට පසුව තවත් මැතිවරනයක් පාසා, දශ ලක්ෂ සංඛ්‍යාත සාමාන්‍ය මහජනයා නැවත නැවතත් ඡන්දය දී ඇත්තේ සාමය, මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් සහ වැඩි දියුනු ජීවන කොන්දේසි තහවුරු කරනු ඇතැයි තමන් විශ්වාස කරන පක්ෂවලට ය. එහෙත් කුමාරතුංගගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සහ ප්‍රතිවාදී එක්සත් ජාතික පක්ෂය (එජාප), නැවත නැවතත් ඔප්පු කර ඇත්තේ, මෙම අති මූලික අභිලාෂයන් සන්තර්පනය කිරීමෙහි ලා ඒවාට ඇති නොහැකියාව යි.

හිටපු එජාපෙ ආන්ඩුව 2001 මැතිවරනය ජය ගැනීමෙන් පසුව වත්මන් “සාම ක්‍රියා දාමය” ආරම්භ කලේ ය. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරිකයන් අතර ආධිපත්‍ය දරන කොටස්වල පිටුබලය සහිතව ගෙන ගිය මෙම ක්‍රියා දාමයේ අරමුන වූයේ කම්කරු පන්තිය අන්‍යොන්‍ය වසයෙන් සූරාකෑම උත්සන්න කරනු වස් එල්ටීටීඊය සමග, ජනවාර්ගික පදනමකින්, බලය බෙදා ගැනීමේ සම්මුතියක් අටවා ගැනීම යි. එජාපෙ “යලි පුබුදමු ශ්‍රී ලංකා” වැඩ පිලිවෙල මගින් පැහැදිලි වූ පරිදි, සාම සම්මුතියක් වනාහි, දිවයිනේ පොදු කාර්ය ව්‍යුහයට නව පෙනුමක් ලබා දීම, රාජ්‍ය අංශය කප්පාදු කිරීම සහ -- චීන ප්‍රධාන භූමියට හොං කොං දක්වන සම්බන්ධතාව පිලිබිඹු කරමින් -- කලාපය වෙනුවෙන්, භූගෝලීය ආයෝජන මධ්‍යස්ථානයක් බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම එල්ල කර ගත් මහේච්ඡ ආර්ථික ප්‍රතිව්‍යුහකරන සැලසුමක එක් අංගයකි.

කෙසේ වෙතත්, 1948 නිදහස ලැබූ දා පටන් ම, සමාජ ආතතීන් අපසරනය කිරීමේ ද වැඩ කරන ජනතාව ජන වාර්ගික රේඛා ඔස්සේ බෙදීමේ ද විධි ක්‍රමයක් ලෙස දෙමල විරෝධී ස්වෝත්තමවාදය මත යැපී ඇති කොලඹ දේශපාලන සංස්ථාපිතය, ඊනියා සාම ක්‍රියා දාමය මගින්, ප්‍රගාඪ ලෙස අස්ථාවර කෙරී තිබේ. 1983 දී සිවිල් යුද්ධය පිපුරුනේ එජාප ආන්ඩුව, සිය නිදහස් වෙලඳ පොල පිලිවෙත්වලට එරෙහිව වැඩෙන විරුද්ධත්වයට මුහුන දුන් තතු තුල ජීවිත සිය ගනනක් බිලිගත් දුෂ්ට දෙමල විරෝධී ජන ඝාතන ව්‍යාපාරයක් අවුලුවාලීමෙන් අනතුරුව ය.

එජාප හා ශ්‍රීලනිප යන පක්ෂ දෙක ම, සිංහල බෞද්ධ ප්‍රභූවේ දේශපාලන ආධිපත්‍යය දිගට ම පවත්වා ගෙන යාම එල්ලය කර ගත් මුර්ග සිවිල් යුද්ධයට නායකත්වය දී ඇත. එනයින් හමුදාව, රාජ්‍ය නිලධරය, බෞද්ධ භික්ෂූන් සහ වඩා පසුගාමී ව්‍යාපාරික කොටස් අතර ගැඹුරින් මුල් බැස ගත් අවශ්‍යතා සැලකිය යුතු මට්ටමකින් නිර්මානය කෙරී ඇත. විශේෂයෙන් ම, මිලිටරිය, ශ්‍රී ලංකාවේ දේශපාලනය තුල බලගතු ස්වතන්ත්‍ර බලවේගයක් බවට පත්ව තිබේ. 2002 සටන් විරාමයේ පටන්, සන්නද්ධ හමුදාවෝ, කුමාරතුංගගේ කුමන්ත්‍රනකාරී සහයෝගය සහිතව, සාම ක්‍රියා දාමයට වල කපනු පිනිස එකකට පසුව තවෙකක් වසයෙන් ප්‍රකෝපකරනයන් සිදු කොට ඇති අතර තර වූ නිලධාරි පැලැන්තියක වරප්‍රසාදිත තත්වය ආරක්ෂා කරති.

පසු ගිය නොවැම්බරයේ දී, මිලිටරියේ හා ජවිපෙ පිටුබලය සහිතව, කුමාරතුංග සිය පුලුල් ජනාධිපති බලතල යොදා ගනිමින් මූලික අමාත්‍යංශ තුනක් පවරා ගත්තා ය. පෙබරවාරියේ දී ඇය, හිතුවක්කාරී ලෙස එජාපෙ ආන්ඩුව බලයෙන් පහ කලා ය. ඇගේ ශ්‍රීලනිපය, රැකියා, සමාජ සේවාවන් හා සහනාධාර කප්පාදු කිරීමේ එජාපෙ ප්‍රහාරවලට එරෙහි මහජන වෛරය ගසාකමින්, මැතිවරනය තරඟ කරනු පිනිස ජවිපෙ සමග එකතු වී එජනිස සභාගය ගොඩ නැගී ය. එහෙත් අප්‍රේල් මැතිවරනයෙන් අවිනිශ්චිත ජයග්‍රහනයක් ලබා ගැනීමෙන් පසුව කුමාරතුංග මුහුන දී සිටින්නේ ද හරියට ම බලයෙන් පහ වූ එජාපෙ නායක රනිල් වික්‍රමසිංහ මුහුන දුන් උභතෝකෝටිකයට ම ය.

නැගෙන භූගෝලීය තෙල් මිල මගින් තව දුරටත් උත්සන්න කෙරෙන, ගැඹුරු ආර්ථික අර්බුදයක, රට ගිලී පවතී. සුලුතර එජනිස ආන්ඩුව ජීවන තත්වයන් වැඩි දියුනු කිරීම පිලිබඳ සිය මැතිවරන පොරොන්දුව ඉක්මනින් ම අත හැර දමා ඇති අතර, එම තතු, මූලික තෙල් කර්මාන්තය ඇතුලු ක්ෂේත්‍රවල වැඩෙන වර්ජන හා විරෝධතා රැල්ලකට තුඩු දී තිබේ. අත්‍යවශ්‍යව පවතින ජාත්‍යන්තර මූල්‍ය ආධාර ලබා ගනු පිනිස එජනිස, එජාපෙ ආර්ථික ප්‍රතිව්‍යුහකරන පිලිවෙත් ඉදිරියට ගෙන යමින් සාම සාකච්ඡා යලි ඇරඹීමේ ප්‍රයත්නයක ද යෙදී සිටී. කෙසේ වෙතත්, ජනමාධ්‍යවල කොටස් සහ ජවිපෙ හා සෙසු සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම් එල්ටීටීඊයට සහන දීම පිලිබඳ ඕනෑම ඉඟියක් රට පාවාදීමක් ලෙස වහාම හෙලා දැක ජනවාර්ගික සතුරුකම් අවුලුවති.

මිලිටරි ගැටුමකට අනිවාර්‍යයෙන් ම තුඩු දෙන, මෙම සමාජ හා දේශපාලන ප්‍රතිවිරෝධතාවන්ගෙන් මිදී ගැනීමේ මාවතක් සොයා ගැනීමෙහි ලා පාලක පන්තිය අසමත්ව සිටී. යලිත් යුද්ධය ඇවිලීමක තතු යටතේ, ආන්ඩුව මිලිටරි යන්ත්‍රය නඩත්තු කරනු පිනිස, ජීවන මට්ටම් රුදුරු ලෙස කප්පාදු කිරීමේ පිලිවෙත් ක්‍රියාවට දැමීම අනිවාර්‍ය වනු ඇත. මෙම පිලිවෙත්

බලාත්කාරයෙන් පැටවීමත් යුද්ධය ගෙන යාමත් සඳහා, ඒවාට එරෙහි වන මොන යම් හෝ විරුද්ධත්වයක් මඩිනු පිනිස, කුමාරතුංග, වඩ වඩාත් ආඥාදායක පාලන රූපයන් කරා යනු ඇත.

ජවිපෙ විසින් අතිශයින් ම භයානක ක්‍රියා කලාපය ඉටු කෙරෙනු ඇතැයි සමාජවාදී සමානතා පක්ෂය අනතුරු අඟවයි. 1980 ගනන් අග දී, එවක නීති විරෝධී සංවිධානයක් වූ ජවිපෙ, ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහි වූ, සිය "දේශප්‍රේමී" උද්ඝෝෂන ව්‍යාපාරය ඉදිරියට ගෙන යනු පිනිස එල්ල කල ෆැසිස්ට් ප්‍රහාරවලින් කම්කරුවන්, වෘත්තීය සංගමිකයන් හා දේශපාලන විරුද්ධවාදීන් සිය ගනනක් මරා දැමී ය. 1994 දී නිල දේශපාලනයට යලි ගෙන ඒමෙන් පසුව, දැන් ප්‍රථම වතාවට ආන්ඩු බලයේ සිටින ජවිපෙ, යුද්ධයට එරෙහි මොන යම් හෝ විරුද්ධත්වයක් පාගා දමනු පිනිස අතිශයින් ම ආන්තික විධි ක්‍රම යොදා ගැනීමට නොපැකිලෙනු ඇත.

ඊනියා සාම්ප්‍රදායික කම්කරු පක්ෂ එකක් වත්, මොන යම් හෝ විකල්පයක් ඉදිරිපත් කොට නැත. ඔවුන් සියල්ලෝ ම කම්කරු පන්තියේ අවශ්‍යතා ධනේශ්වරයේ ඒ හෝ මේ කොටසට විවෘතව ම යටත් කරති. ලංකා සම සමාජ පක්ෂය සහ කොමියුනිස්ට් පක්ෂය, දශක හතරක් තිස්සේ, කුමාරතුංගගේ ශ්‍රීලනිප සමග සහාගගතව සිටිමින් එහි වර්ගවාදී දේශපාලනයට මුලුමනින් ම දායක වී තිබේ. නව සම සමාජ පක්ෂය අවධාරනය කරන්නේ "සාම ක්‍රියා දාමය" තුල, පාලක ප්‍රභූන් ගෙන යන යටි කුට්ටු රහස් ගනුදෙනු මත, වැඩ කරන ජනතාව විශ්වාසය තැබිය යුතු බව යි.

කම්කරු පන්තියට පාලක පන්තියේ මොන යම් හෝ කොටසක් පිලිබඳව කිසිදු දේශපාලන විශ්වාසයක් තැබිය නොහැකි ය. ශ්‍රී ලංකාවේ සමස්ත පරම්පරාවක් ම හැදී වැඩී ඇත්තේ යුද්ධයේ කලු වැස්ම යටතේ ය. දස දහස් ගනනකගේ ජීවිත කැප කෙරී ඇති අතර තවත් බොහෝ ගනනක් අංග විකල තත්වයට හෝ සරනගතයන් බවට පත් කරනු ලැබ සිටිති. මිලිටරිවාදය සහ වර්ගවාදී දේශපාලනය මගින් දෛනික ජීවිතයේ සෑම අංගයක් ම විෂ කැවී ඇත. මෙම තතු වෙනස් කල හැක්කේ, ධනේශ්වර දේශපාලනයේ සමස්ත අට්ටාලයෙන් ම ද මෙම විනාශකාරී යුද්ධයට වගකිව යුතු සියල්ලන්ගෙන් ම ද පරිපූර්නව බිඳී වෙන් වීම මගින් ම පමනි.

අව්‍යාජ සාමය, ප්‍රජාතන්ත්‍ර අයිතීන් සහ ශිෂ්ට සම්පන්න ජීවන තත්වයන් සඳහා වැඩ කරන ජනතාවට පවත්නා අවශ්‍යතා මගින් ඉල්ලා සිටින්නේ වත්මන් ව්‍යසනයේ නිර්මාපකයන් වන දේශපාලන සංස්ථාපිතය සහ රාජ්‍ය යන්ත්‍රය විප්ලවවාදීව පෙරලා දැමීමට නොඅඩු දෙයකි. මෙම කර්තව්‍යය ඉටු කිරීමට සමත් එකම සමාජ බලවේගය නම්, පීඩිත ග්‍රාමීය හා නාගරික මහජනතාවට නායකත්වය දෙන කම්කරු පන්තිය යි.

කම්කරු පන්තිය තමන්ගේ ම ස්වාධීන පන්ති අවශ්‍යතා වෙනුවෙන් සටන් කිරීමේ ද පීඩිත ගම්බද හා නගරබද ජනයා තමන් පිටුපසින් රැලි කර ගැනීමේ ද දේශපාලන මූලෝපායක් විස්තාරනය කර ගත යුතු ය. එවන් ව්‍යාපාරයක් සඳහා පවත්නා අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසිය නම්, වර්ගවාදයේ හා ස්වෝත්තමවාදයේ සියලුම රූපාකාරයන්ට ක්ෂමා විරහිතව එරෙහි වීම සහ ජනවාර්ගිකත්වය, ආගම හා භාෂාව නොතකා සියලු වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම යි. කම්කරුවෝ -- සිංහල සහ දෙමල, බෞද්ධ, මුස්ලිම්, ක්‍රිස්තියානි සහ හින්දු -- පොදු පීඩකයකුට මුහුන දී සිටින අතර යුද්ධයට හා සමාජ අසමානතාවට එරෙහිව ඒකාබද්ධ අරගලයක් ගෙන යා යුත්තාහ.

උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු ම ශ්‍රී ලංකා මිලිටරි හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කල යුතු යයි සමාජවාදී සමානතා පක්ෂය ඉල්ලා සිටී. ඒකීය රාජ්‍යය බලාත්කාරයෙන් පවත්වා ගෙන යාම තුඩු දී ඇත්තේ රට පුරා මිලිටරිවාදය හා ස්වෝත්තමවාදය තව දුරටත් ශක්තිමත් කිරිමට ය. හමුදා ඉවත් කිරිම සඳහා මූලිකත්වය ගැනීම මගින් කම්කරු පන්තිය, අතලොස්සකගේ ලාභ වෙනුවට බහුතරයේ අවශ්‍යතා සැපිරීමේ පොදු සමාජවාදී ක්‍රියාමාර්ගයක් වටා, දෙමල හා සිංහල මහජනතාව ඒකාබද්ධ කරන බලගතු ආකර්ෂන ධ්‍රැවයක් බවට පත් වනු ඇත.

ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ සියලු නොවිසඳුනු ගැටලු විසඳාලනු පිනිස, සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ විවෘත හා නිදහස් ඡන්දයෙන් තේරී පත් වන නියෝජිතයන්ගෙන් සමන්විත, අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් කැඳවිය යුතු යයි සසප ඉල්ලා සිටී. ඉන්දියානු උප-මහාද්වීපයේ හා ජාත්‍යන්තරව සමාජවාදී සමූහාන්ඩු සංගමයක් සඳහා ගෙන යන වඩා පුලුල් සටනක කොටසක් ලෙස ඊලම්-ශ්‍රී ලංකා එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් ගොඩ නැගීම පිනිස වූ අරගලය සමග මෙය අත්‍යන්තයෙන් ම බැඳී පවතී.

සමාජවාදී සමානතා පක්ෂය, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ කොටසක් ලෙස, ශ්‍රී ලංකාව තුල හා කලාපය පුරා මෙම සමාජවාදී හා ජාත්‍යන්තරවාදී ක්‍රියාමාර්ගය සඳහා සටන් වදී. අපගේ ඉදිරිදර්ශනය බැරෑරුම්ව සලකා බලන ලෙසත් අපගේ පක්ෂයට බැඳී එය ගොඩ නැගීමට සටන් වදින ලෙසත් ශ්‍රී ලංකාවේ හා ඉන්දියානු උප-මහාද්වීපයේ සියලු සසප ආධාරකරුවන්ගෙන් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පාඨකයන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

© www.wsws.org